# අත් වැස්ම

යුක්රේනියානු
ජනකතාවකි

# අත් වැස්ම

අගහස් ප්‍රකාශන

# අත් වැස්ම

යුක්රේනියානු ජනකතාවකි

චිත්‍ර

ඊ. රචෙව්

මුද්‍රණය හා ප්‍රකාශනය

අගහස් ප්‍රකාශන

ප්‍රථම මුද්‍රණය 2015

දවසක් එක මහලු මිනිහෙක් තමාගේ බල්ලාත් සමග කැලෑවක් මැදින් ගමනක් ගියා. තද ශීත නිසා මහලු මිනිහා අත්වැසුම් සහ හිම කබායක් හැඳ සිටියා. අතර මගදී ඔහුගේ අත්වැස්මක් කැලෑව මැද වැටුණා.

එතකොටම වාගේ මීයෙක් දුවගෙන, දුවගෙන ඇවිල්ලා අත්වැස්ම දිහා බලා කිව්වා,

"මේ අත්වැස්ම ඇතුළේ මම පදිංචි වෙනවා" කියලා

ටික වේලාවක් යනකොට, පැන පැන ආපු ගෙම්බෙක් අත්වැස්ම දැකලා ඇසුවා:

"බක! බක! කවුද මේකෙ ඇතුළේ පදිංචි වෙලා ඉන්නේ?"

"මම තමයි ලියන අප්පු. ඔයා කවුද?" කියලා මීයා ඇසුවා.

"මම තමයි මඩසේන. මමත් ඔයාගේ ගෙදරට එන්නද?"

"හොඳයි එන්න" කියලා මීයා කීවා.

ගෙම්බයි මීයයි දෙන්නාම අත්වැස්ම ඇතුළේ පදිංචි වෙලා ඉන්නකොට එතැනට හාවෙක් ආවා

අත්වැස්ම දුටු හාවා ඇසුවා: "කවුද මෙතැන පදිංචි වෙලා ඉන්නේ?"

“මේ ගෙදර ඉන්නෙ අපි. අපේ නම් තමයි ලියනෙ අප්පු සහ මඩසේන. ඔහේ කවුද?” කියලා මීයයි ගෙම්බයි ඇසුවා.

“මගේ නම පිනුම් හාමි. මමත් එන්න ද ඔතන නවතින්න?”

“හොඳයි එන්න” කියලා මීයයි ගෙම්බයි කිව්වා.

හාවාට ඉඩ දීලා මීයයි ගෙම්බයි අයිනට වුණා. දැන් මේ තුන්දෙනාම අත්වැස්ම ඇතුළේ පදිංචි වෙලා.

ටික වේලාවකින් එක නරියෙක් එතැනට ආවා.

"හූ-හූ-හූ කවුද මේ ගෙදර පදිංචි?"

"මේ ගෙදර පදිංචි කාරයෝ අපි තමයි. අපේ නම් තමයි ලියන අප්පු, මඩසේන සහ පිනුම් හාමි. ඔයා කවුද?" කියලා මීයයි. ගෙම්බයි, හාවයි ඇසුවා.

"මගේ නම කපටිරාළ. මටත් ඉඩ දෙනවද මේ ගෙදර පදිංචි වෙන්න?"

නරියාට ඉඩ දීලා මීයයි, ගෙම්බයි, හාවයි අයිනට වුණා. දැන් මේ ගෙදර පදිංචිකාරයෝ සතර දෙනෙකි.

ටික වේලාවකින් එතැනට වෘකයෙක් ආවා. අත්වැස්ම දැකලා වෘකයා ඇසුවා:

"ආයුබෝවන් ! කවුද ගෙදර?"

"ලියන අප්පු, මඩසේන, පිනුම් හාමි, සහ කපටිරාළ වන අපි තමයි මේ ගෙදර පදිංචි කාරයෝ. ඔහේ කවුද?"

"මම තමයි දිගංචියා. මටත් පුළුවනි ද ඔය ගෙදර පදිංචි වෙන්න?" කියලා වෘකයා ඇසුවා.

"හා, හා, හොඳයි, එනවා" කියලා අනිත් හතරදෙනා කීවා.

වෘකයාට ඉඩ දීලා අනිත් හතර දෙනා අයිනට වුණා. දැන් පස් දෙනෙක් අත් වැස්ම ඇතුළේ ඉන්නවා. ටික වේලාවකින් වල් ඌරෙක් ආවා.

"කූරු, කූරු කූරු කවුද ගෙදර?" කියලා වල් ඌරා ඇසුවා.

"ලියන අප්පු, මඩසේන, පිනුම්හාමි, කපටිරාළ සහ දිගංචියා වන අපි තමයි මේ ගෙදර ඉන්නෙ. ඔහේ කවුද?" කියලා පස් දෙනාම ඇසුවා.

“මම තමයි කැලෑ රාලහාමි. මටත් ඉඩ දෙනවද ඔයගොල්ල සමග පදිංචි වෙන්න.” කියලා වල් ඌරා ඇසුවා.

“අනේ! අනේ ! මේ පුංචි අත්වැස්ම ඇතුළේ ඉඩ නෑ නොවැ. රාලහාමි වගේ තරබාරු කෙනෙකුට නම් ඇතුල් වෙන්නවත් බෑ.” කියලා යාළුවෝ පස්දෙනා කීවා.

“මොනවා කරන්නද නවතින්න වෙන තැනකුත් නෑ නොවැ.” කියලා වල් ඌරා කීවා.

“හොඳයි එහෙනම් ඇතුල් වෙන්න” කියලා පස් දෙනා කීවා.

බොහොම අමාරුවෙන් වල් ඌරත් ඇතුල් වුණා. දැන් අත්වැස්ම ඇතුළේ හය දෙනෙකි. ඒ ගොල්ලන්ට හැරෙන්ට පෙරලෙන්ටවත් ඉඩ නෑ.

ඔහොම ඉන්නකොට එතනට ආවා වලහෙක්.

"ආයුබෝවන් මිත්‍රවරුනි ! කවුද මේ ගෙදර" කියලා වලසා ඇසුවා.

"ලියන අප්පු, මඩසේන, පිනුම් හාමි, කපටිරාල, දිගංචියා සහ කැලෑ රාලහාමි වන අපි හයදෙනා තමයි මෙහි පදිංචි කාරයෝ. ඔයාගේ නම මොකක්ද?" කියලා හයදෙනාම අසුවා.

"මම තමයි යෝදයා. මට පේනවා මිත්‍රවරු බොහොම තදබද්දේට ජීවත් වෙන හැටි. ඒ වුණාත් මට ඉඩ නොදී යන එකක් නෑ කියලා මම සිතනවා." කියලා වලසා කීවා.

"අනේ අපට හුස්ම ගන්නවත් බෑ කොහෙත්ම ඉඩ නෑ"

"මිත්‍රවරුනි ! තියන හැටියකට යන්තම් ඉඩ ලැබුණොත් ලොකු උදව්වක්."

"හොඳයි එහෙනම් එනවා ඇතුළට. හැබැයි බොහොම ප්‍රවේසමෙන්" කියලා අනිත් හයදෙනාම කීවා.

වලසා ඇතුල් වූ විගසම අත්වැස්ම පුපුරන්න මෙන් කිටි කිටි ගාන්න පටන් ගත්තා.

තමාගේ අත්වැස්මක් නැති වූ බව දැනගත් මහලු මිනිහා එය සොයමින් ආපසු ආවා. ඔහුගේ බල්ලා බුරමින් සෑම තැනම දුවන්ට පටන් ගත්තා. හිම මත වැටී තිබුණු අත්වැස්ම ඒ මේ අත සෙලවෙන සැටි බල්ලා දැක්කා.

"හව් ! හව් ! හව් !" ගාමින් බල්ලා බිරුවා.

අත්වැස්ම ඇතුළේ සිටි යාලුවෝ හත්දෙනා හොඳටම බය වෙලා එළියට පැන්නා. ඔවුන් ඒ මේ අත දිව්වා.

මහලු මිනිහා ඇවිත් අත්වැස්ම අහුලාගෙන යන්නට ගියා.


















අගහස් ප්‍රකාශන
717/2, මාදින්නාගොඩ, රාජගිරිය.
0112793671 | 0773985968
agahaspublications@gmail.com

ISBN 978-955-0230-48-8

මිල රු. 150/-